

# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය



## පුරප්පාඩු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### (1) හෙද නිලධාරි II ශ්‍රේණිය

**සුදුසුකම් :**

(1) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව, විෂයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් විය යුතු ය.

(2) හෙදියක වශයෙන් ප්‍රවීණතාව ලබා ඇති බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් සහතිකය ලබා සිටිය යුතු ය.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**වැටුප් පරිමාණය :** රු. 51,095 - 7x540; 11x640; 10x890; 13x1,190 - 86,285 (මාසික)
U-MT 1-2025

**බඳවාගනු ලබන ආකාරය :** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සැලකිය යුතුයි -** මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන අය සඳහා මූලික වැටුපට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ද ගෙවනු ලබන අතර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල හා සේවා නියුක්තයින්ගේ භාර අරමුදල යන ඒවායේ දායකත්වය හිමි වේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) හි දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුව වැටුප ගෙවනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

මේ සඳහා වන අයදුම්පත් **www.wyb.ac.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි ය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 ජූනි මස 22 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන සේ නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු ය. අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කළ ඡායා පිටපත් පමණක් (සාම විනිසුරු වරයෙකු/ ග්‍රාම නිලධාරී වරයෙකු/ විදුහල්පතිවරයෙකු/ රජයේ හෝ සංස්ථාවක විධායක නිලධාරියකු විසින් නිල මුද්‍රාව සහිතව සහතික කර තිබිය යුතු ය.) අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය. අසම්පූර්ණ හෝ ඉහත සුදුසුකම් සපුරා නොමැති හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
2026-05-31 වන දින